# බෝතට පුරාණ විහාරයේ බිතුසිතුවම් පිළිබඳ ව අධ්‍යනයක්

කේ.ජී.එම්.එස්.කේ. ජයරත්න[33]

මහනුවර හාරිස්පත්තුව බෝතට ග්‍රාම සේවා වසමට අයත් බෝතට පුරාණ විහාරය කුඩා කඳුගැටයක් මධ්‍යයේ පිහිටා ඇත. මෙම විහාරගෙය හා එහි ඉදිකිරීම් දෙස බලන විට මහනුවර යුගයට අයත් නිර්මාණ ලක්ෂණ වලින් යුතු වේ. විහාර පිවිසුම් දොරටු මහනුවර යුගයට අයත් සඳකඩපහණින්, පියගැට පෙළ ආදීයෙන් අලංකාර කර ඇත. සිව් දිශාවට මුහුණලා ඇති විහාරගෙය පිවිසුම් දොරටු දෙකකි. විහාරගෙය තුළ ප්‍රධාන හිඳි හා සැතපෙන බුද්ධ ප්‍රතිමා ගෘහ දෙකක් සහ තවත් කොටස් වලින් යුතුවේ. ප්‍රධාන හිඳි හා සැතපෙන බුද්ධ ප්‍රතිමා ගෘහ දෙස බැලිමෙ දි දඹුලු විහාරය සිහි ගන්වනු ලබයි. ප්‍රධාන පිළිම වලට අමතර ව පරිවාර හිටි පිළිම, විෂ්ණු, නාථ දේව ප්‍රතිමා, මකර රූව ආදිය දක්නට ලැබේ. විහාරගෙය වියන්තලය සහ බිත්ති මහනුවර යුගයට අයත් සිතුවම් වලින් අලංකාර කර ඇති බව දක්නට ලැබේ. මහනුවර යුගයට අයත් සිතුවම් අතර අට විසි බුද්ධ රූප, ප්‍රහේළිකාර සිතුවම්, මාරපරාජය, මල් මොස්තර ආදිය දක්නට ලැබේ. වර්ණ භාවිතය ගත් විට කහ, රතු, සුදු, නිල් මෙන් ම පහතරට සම්ප්‍රදායේ යෙදෙන කළු වර්ණය ද භාවිතා වී ඇත. විදේශිය ආභාෂය මත නිර්මාණය වු සිතුවම් ද දක්නට ලැබේ. මහනුවර හා ඉන් පසු යුග වලට අයත් සිතුවම් වල විදේශිය ආභාසය ලද බව ඇඳුම් වලින් සහ ගෘහ නිර්මාණ ලක්ෂණ වලින් දක්නට ලැබේ. මෙබඳු ලක්ෂණ වලින් යුතු බෝතට පුරාණ විහාරයේ නිරූපිත සිතුවම් අතිශය වැදගත් බව පෙන්වාදිය හැකි ය.

ප්‍රමුඛ පදඃ බෝතට පුරාණ විහාරය, සිතුවම්

[33] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.